# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 34 දරන කුඩා තේ වතු සංවර්ධන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ **2003** ඔක්තෝබර් මස **22** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 ඔක්තෝබර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල :** රු. **5.50** යි. තැපැල් ගාස්තුව **:** රු. **4.50** යි.

# 2003 අංක 34 දරන කුඩා තේ වතු සංවර්ධන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 ඔක්තෝබර් මස 22 වැනි දින]

එල්. ඩී.–ඕ. 14/99.

## ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය.

**1**. මේ පනත 2003 අංක 34 දරන කුඩා තේ වතු සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන පනතේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනතේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"අධිකාරියේ සාමාජිකයන්.

4. අධිකාරිය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) 8අ වගන්තිය යටතේ පත් කරන ලද සභාපතිවරයෙක් ;

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරන ලද පහත දැක්වෙන නම් කළ සාමාජිකයන් එනම් :-

(i) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන තේ මණ්ඩල පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නියෝජිතයෙක් ;

(ii) 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ තේ පර්යේෂණ මණ්ඩලය මගින් නඩත්තු කරනු ලබන හා පාලනය කරනු ලබන තේ පර්යේෂණ ආයතනයේ නියෝජිතයන් දෙදෙනෙක් ;

(iii) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ වගකීම් සීමාසහිත සමාගමක්

2-H 019146 - 4,500 (2003/07)

ලෙස ලියාපදිංචි කර ඇති පෞද්ගලික තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය විසින් ශ්‍රී ලංකා තේ සංගමය (ටී.ඒ. එස්. එල්.) අමතා නම් කරනු ලබන පෞද්ගලික තේ කර්මාන්ත ශාලා හිමියන්ගේ සංගමයේ නියෝජිතයෙක් ;

(iv) මේ පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනය විසින් ශ්‍රී ලංකා තේ සංගමය (ටී. ඒ. එස්. එල්) අමතා නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ;

(v) වැවිලි කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නිර්නායන පදනම්කොට තෝරා ගනු ලැබිය යුතු වෘත්තීය සමිති නියෝජනය කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු :

මේ අනුඡේදයේ කාර්ය සඳහා "වෘත්තීය සමිතියක්" යන්නට (138 වන අධිකාරය වන) වෘත්තීය සමිති ආඥාපනතේ එයට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

(vi) වැවිලි කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙක් ;

(vii) වැවිලි කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයා විමසා මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(viii) (291 වන අධිකාරය වූ) ලංකා වැවිලිකරුවන්ගේ සංගමය ආඥාපනත මගින් පිහිටුවනු ලැබූ ලංකා වැවිලිකරුවන්ගේ සංගමය විසින් ශ්‍රී ලංකා තේ සංගමය (ටී. ඒ. එස්. එල්) අමතා නම් කරනු ලබන ඒ සංගමයේ නියෝජිතයෙක්.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය "තුන" යන වචනය වෙනුවට "පහ" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "සෑම සාමාජිකයකු විසින්ම" යන වචන වෙනුවට "4 වන වගන්තියේ (ආ) ඡේදය යටතේ නම් කරනු ලබන සෑම සාමාජිකයෙක් විසින් ම" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(2) (අ) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් අමාත්‍යවරයා විසින් තත් කාර්ය සඳහා හේතු දක්වා-

(i) 4 වන වගන්තියේ (ආ) ඡේදයේ (vi) වන අනුඡේදය යටතේ අධිකාරියට නම් කරන ලද සාමාජිකයකු හැර වෙනත් යම් සාමාජිකයෙක් ;

(ii) 4 වන වගන්තියේ (ආ) ඡේදයේ (vi) අනුඡේදය යටතේ යම් සාමාජිකයකු නම් කළ අදාළ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ඒ සාමාජිකයාගේ,

ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ආ) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ආඥාවක් කරනු ලබන්නේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද ඒ සාමාජිකයකු, ගැසට් පත්‍රයේ නියමය පළ කරනු ලබන දිනයේ දී ධූරය අත්හැර ගිය ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) ඒ වගන්තියේ (1) වන හා (3) වන උපවගන්තිවල "සාමාජිකයකු" යන වචනය යෙදී ඇති කවර හෝ ස්ථානයක දී "4 වන වගන්තියේ (ආ) ඡේදයේ (v) අනුඡේදය යටතේ නම් කරනු ලබන නියෝජිතයකු" යන වචන ආදේශ කිරීමෙන්.".

ප්‍රධාන ප්‍රඥප්තියට 8අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**6**. පහත දැක්වෙන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර එය 8අ වගන්තිය වශයෙන් බලපැවැත්වේ.

"සභාපතිවරයා පත් කිරීම.

8අ. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයකු සිටිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (ඈ) ඡේදය (උ) ඡේදය වශයෙන් නැවත අංක යෙදීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :–

(ඈ) කුඩා තේ වතුවල ආයෝජනය ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) දත්ත එකතු කිරීමට හා බෙදා හැරීමට භාර ගැනීම සහ කුඩා තේ වතුවල සංවර්ධන හැකියාව දැන ගැනීම ;

(ඊ) උචිත ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යාංශයට උපදෙස් දීම සහ වෙනත් අදාළ නියෝජිත ආයතන සමග සම්බන්ධීකරණය කිරීම.

අන්තර්කාලීන විධිවිධාන.

**8**. මේ පනත ආරම්භවීමට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන්නා වූ අධිකාරියේ සාමාජිකයන් මේ පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය යටතේ අධිකාරිය නැවත සංස්ථාපනය කරන තෙක් එලෙස ධුර දැරීම දිගටම කරගෙන යා යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**9**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.